කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


**නිවේදන අංකය : 12** **WW/TC/20/11/24/12**
**වර්ණය : රතු**


# තද වැසි, තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිලිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2020 නොවැම්බර් මස 24 වන දින ප.ව. 07.30 ට නිකුත් කරන ලදී.**

## උතුරු-නැගෙනහිර ගොඩබිම් සහ එම මුහුදු ප්‍රදේශ සඳහා

## සැලකිලිමත් වන්න!

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "නිවාර්" සුළි කුණාටුව අද (24) සවස 02.30 වන විට ලංකාවේ කන්කසන්තුරය වෙරළට කි.මී. 280ක් නැගෙනහිරින් (10.0N, 82.6E) ස්ථානගතව පැවතුනි. එය ඉදිරි පැය 36ක කාලය තුළ චන්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වෙමින් දිවයිනේ උතුරු වෙරළ ආසන්නයෙන් ඉන්දියාවේ තමිල්නාඩු වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**




**Source: RSMC India**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| පුරෝකථන සුළි කේන්ද්‍රය සහ මධ්‍ය ලක්ෂයේ සිට කන්කසන්තුරයට දුර | | |
|---|---|---|
| දිනය/ වේලාව (ශ්‍රී. ලං. ස. වේ.)(පැය) | ස්ථානය (උතුරු අක්ෂාංශ/නැගෙනහිර දේශාංශ) | කන්කසන්තුරයට දුර (කි.මී) |
| 2020.11.24/2330 | 10.2N/81.9E | 208 |
| 2020.11.25/0530 | 10.6N/81.3E | 160 |
| 2020.11.25/1130 | 11.2N/80.6E | 170 |
| 2020.11.25/2330 | 12.1N/79.5E | 260 |

## අනතුරු ඇඟවීම්:

**මුහුදු ප්‍රදේශය සඳහා:**
ඉහත පද්ධතියේ බලපෑම හේතුවෙන්, ඉදිරි පැය 24 තුළදී දිවයිනේ උතුරු සහ නැගෙනහිර ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක. සුළං වේගය ක්ෂණිකව පැ.කි.මී. (80-100) පමණ ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශය විටින් විට ඉතා රළු හෝ දළ රළු විය හැක.

පුත්තලම සිට කොළඹ හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී.

ඉදිරි දිනවලදී, මන්නාරම සිට කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශ වල මුහුදු රළ මීටර්(2.0-3.0) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.

### ගොඩබිම ප්‍රදේශ සඳහා:
නැගෙනහිර, උතුරු සහ උතුරු මැද පළාත්වල විටින් විට පැ.කි.මී.(60-70) පමණ දක්වා වන ඉතා තද ප්‍රභාරාත්මක සුළං ඇති විය හැක. සෙසු ප්‍රදේශවල පැ.කි.මී.(40-50) පමණ දක්වා වන ප්‍රභාරාත්මක තද සුළං ඇති විය හැක.

| පළාත | නොවැ. 24 | නොවැ. 25 | නොවැ. 26 |
|---|---|---|---|
| උතුර | බොහෝ ස්ථානවල වැසි; තැනින් තැන මි.මී. 100 ට වැඩි වැසි; (විශේෂයෙන් යාපනය අර්ධද්වීපයේ) | බොහෝ ස්ථානවල වැසි; ස්ථාන ස්වල්පයක මි.මී. 75 ට වැඩි වැසි; (විශේෂයෙන් යාපනය අර්ධද්වීපයේ) | තැනින් තැන වැසි |
| උතුරුමැද | තැනින් තැන මි.මී.50 ට වැඩි වැසි; | විටින් විට වැසි ස්ථාන ස්වල්පයක මි.මී. 75 ට වැඩි වැසි; | සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක. |
| නැගෙනහිර | තැනින් තැන මි.මී.(25-50) වැසි; (විශේෂයෙන්ම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ) | වැසි ස්වල්පයක් | සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක. |

අවදානම් රහිත | අඩු අවදානම් | තරමක් අවදානම් | අධි අවදානම්

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා වන වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.**
- දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩබිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.
- පුත්තලම සිට කොළඹ හරහා මාතර දක්වා වන මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවල යෙදීමේදී වඩාත් අවදානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටින අතර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ සිය අවධානය යොමුකරන ලෙස තවදුරටත් ඉල්ලා සිටිනු ලැබේ.

**ගොඩබිම ප්‍රදේශය සඳහා:**

- උතුර, නැගෙනහිර සහ උතුරුමැද පළාත් වල ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් සිටින්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

**මීළඟ නිවේදනය 2020.11.24 දින ප.ව. 10.30 ට නිකුත් කෙරේ.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **12** WW/TC/20/11/24/12
COLOR: **RED**


# Warning for Heavy rain, Strong winds and Rough seas

Issued by the Natural Hazards Early Warning Centre
Issued at 07.30 p.m. 24th November 2020

## For Eastern-Northern Land and Sea areas

### PLEASE BE AWARE!

**The Cyclonic Storm "NIVAR" over southwest Bay of Bengal is located near (10.0N, 82.6E) at 1430hrs today (24), 280km to the east of Kankasanthurai coast. It is very likely to intensify into a Severe Cyclonic Storm and expected to move west-northwestwards and cross Tamil-Nadu coast, India during next 36 hours.**




**Source: RSMC India**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| Forecast position and approximate distance to the center location from Kankasanthurai | | |
|---|---|---|
| **Date/Time (SLST) (Hrs)** | **Position (Lat/Lon)** | **Distance to Kankasanthurai (km)** |
| 2020.11.24/2330 | 10.2N/81.9E | 208 |
| 2020.11.25/0530 | 10.6N/81.3E | 160 |
| 2020.11.25/1130 | 11.2N/80.6E | 170 |
| 2020.11.25/2330 | 12.1N/79.5E | 260 |

## WARNINGS:

### For Sea Area

Under the influence of aforementioned system, possibility for intemittent showers or thundershowers and sudden roughness, associated with sudden increase of wind speed up to **(80-100)kmph** is high over Eastern and Northern, deep and shallow sea areas during next 24 hours.

Wind speed can increase up to **(50-60) kmph** at times over sea area extending from Puttalam to Matara via Colombo.

There is a possibility that near shore sea areas off the coast extending from Mannar to Batticaloa via Kankesanthurai and Trincomalee may experience surges due to the effect of swell waves, having (2.0-3.0) m height during next few days.

### For Land Area

Very strong gusty winds (60-70)kmph can be expected in Eastern, Northern and North-Central. Strong gusty winds (40-50)kmph elsewhere.

| Province | 24th Nov. | 25th Nov. | 26th Nov. |
|---|---|---|---|
| **Northern** | Rainfalls at most places, above 100mm at several places, particularly in Jaffna peninsula | Rainfall at many places, above 75mm at a few places, particularly in Jaffna peninsula. | Showers at several places |
| **North-Central** | Rainfall above 50mm at several places. | Showers at times, above 75mm at a few places. | Afternoon thundershowers are likely |
| **Eastern** | Rainfall about (25-50)mm at several places, perticularly in Trincomalee district. | A few showers | Afternoon thundershowers are likely |

No risk Low risk Moderate risk High risk

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## ACTION SUGGESTED:

### For the Sea area:

- **Naval and fishing communities are warned not to venture to the sea areas off the coast extending from Puttalam to Batticaloa via Mannar, Kankasanthurai and Trincomalee.**
- **Those who are out at aforementioned sea regions are advised to return to coasts or moved safer areas immediately.**
- **Naval and fishing communities are request to be vigilant during the activities in the sea areas extending from Puttalam to Matara via Colombo and further requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

### For the Land area:

- **People living in Eastern, Northern and North-Central provinces are requested to be vigilant.**
- **Be alert on the advisories issued by the Department of Meteorology.**
- **For emergency assistance contact the local disaster management authorities.**

**The next bulletin will be issued at 10.30 p.m. on 24 November 2020.**